0105

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන
6 වන මට්ටම 2022/2023

අවසාන පරීක්ෂණය - 2023

**SNU6224/ESU4124-අධ්‍යාපන කළමනාකරණය**

කාලය- පැය තුනයි. (03)

---

දිනය - **2023.12.03** වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**<u>1 වන කොටස</u>**

01. "කළමනාකරණය" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

02. සංවිධානයක අරමුණු සාක්ෂාත් කර ගැනීම සංකීර්ණ විය හැකි ය. එම ආකාරයේ සංකීර්ණත්වය සඳහා හේතු තුනක් (03) සඳහන් කරන්න.

03. "කාර්යක්ෂමතාව" සහ "ඵලදායීතාව" යන සංකල්ප පාසල් සංදර්භයේ උදාහරණ සහිතව වෙන්කොට දක්වන්න.

04. සංවිධානයක දැක්ම හා මෙහෙවර යනු කුමක් ද?

05. එෆ්.ඩබ්ලිව්.ටේලර් (F.W.Taylor) විසින් හඳුන්වා දුන් විද්‍යාත්මක කළමනාකරණයේ න්‍යායේ මූලධර්ම පහක් (05) සඳහන් කරන්න.

06. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ පරිපාලන වගකීම් හතරක් (04) සඳහන් කරන්න.

07. ඵලදායී විදුහල්පතිවරයකුගෙන් අපේක්ෂා කරනු ලබන නායකත්ව ගුණාංග පහක් (05) සඳහන් කරන්න.

08. බ්ලේක් සහ මවුටන් ගේ (Blake & Mouton) කළමනාකරණ දැලිස (The Management Grid) ට අනුව "9.9 නායකත්ව ශෛලිය" කළමනාකරුවකුට යෝග්‍යතම නායකත්ව ශෛලිය වේ. මෙම නායකත්ව ශෛලියේ දී කළමනාකරුවකුගේ භූමිකා හතරක් (04) සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09\. (i) කළමනාකරණ ක්‍රියාවලිය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) කළමනාකරණ ක්‍රියාවලියේ එක් අංගයක් තෝරාගෙන පාසල් කළමනාකාරිත්වයට එහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත තෝරාගත් මූලිකාංගයට අදාළව ගැටලු/අභියෝග දෙකක් **(02)** හඳුනාගෙන එම අභියෝග/ගැටලු ජය ගැනීමට/අවම කිරීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

10\. "පාසලක ඵලදායීතාව තීරණය වන්නේ එම පාසල හඳුනාගත් හා පැහැදිලිව ප්‍රකාශිත ඉලක්ක කරා කොතරම් දුරට ළඟා වන්නේ ද යන්න මත ය."

(i) ඵලදායී පාසලක් යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ ඵලදායී පාසල් හඳුනා ගැනීම පහසු කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිසම යෝජනා කර ඇති නිර්ණායක හතර **(04)** සඳහන් කරන්න. (ලකුණු 08)

(iii) ඉහත නිර්ණායක එකක් **(01)** තෝරාගෙන තෝරාගත් නිර්ණායකයට අදාළව පාසල මුහුණ දෙන ගැටලු දෙකක් **(02)** හඳුනාගෙන, එම ගැටලු මඟහරවා ගැනීම සඳහා යෝජනා දෙකක් **(02)** ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

11\. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ප්‍රශ්න සැම විටම අධ්‍යාපනයේ ගුණාත්මක පරිහානියට බලපායි.

(i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණ ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු හතරක් **(04)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 06)

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණ ක්ෂේත්‍රයේ එවැනි ගැටලු ඇතිවීම ට බලපා ඇති සාධක හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 06)

(iii) ඔබ ඉහත (11 .i) හි සඳහන් කළ ගැටලුවලින් දෙකක් **(02)** තෝරාගෙන, එම ගැටලු මඟහරවා ගැනීම/අවම කිරීම සඳහා යෝග්‍ය විසඳුම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. අධ්‍යාපන කළමනාකරුවන් සඳහා අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ ගුණාත්මක පුහුණුවක් ලබාදීම අධ්‍යාපන අමාත්‍යාංශයේ අත්‍යවශ්‍ය කාර්යයක් ලෙස හඳුනාගෙන ඇත.

(i) අධ්‍යාපන කළමනාකරුවන් සඳහා කළමනාකරණ පුහුණුව අවශ්‍ය වන්නේ ඇයි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) කළමනාකරණ පුහුණුවක දී සළකා බැලිය යුතු ක්ෂේත්‍ර/අංශ හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබා දීමෙන් පසු අධ්‍යාපන පද්ධතියට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. නායකත්වය යනු වැඩිදියුණු කළ කාර්යක්ෂමතාව සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානයේ සම්පත් මෙහෙයවීමට උපකාර වන අත්‍යවශ්‍ය කළමනාකරණ කාර්යයකි.

(i) නායකත්වය යන පදය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඕනෑම නායකත්ව න්‍යායක් පැහැදිලි කොට එහි ප්‍රධාන ගති ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) බ්ලේක් සහ මවුටන් (Blake & Mouton) ගේ කළමනාකරණ දැලිස (The Management Grid) පැහැදිලි කරන්න. (ලකුණු 10)

14. අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුව සඳහා පාසල් පාදක අධීක්ෂණය කාලීන අවශ්‍යතාවයකි.

(i) පාසල් මට්ටමේ අධීක්ෂණ ක්‍රියාවලියේ අරමුණු හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) පන්තිකාමර අධීක්ෂණයේ දී ඵලදායී අධීක්ෂකවරයෙකුගෙන් බලාපොරොත්තු වන ගුණාංග හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) විදුහල්පතිවරයෙකු විසින් අභ්‍යන්තර සුපරීක්ෂණයේ දී මුහුණ පාන ගැටලු හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.